# පොලිස්පති නිල කාර්යාලය

ආර්ටීඑම් : ( 392 )

2020.04.10

පොලිස්පති ගෙන් | සියලු ම : පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: දිසා භාර නියෝජ්‍ය පොලිස්පතිවරුන්
: ප්‍රාදේශීය කොට්ඨාස භාර නිලධාරීන්
: දිස්ත්‍රික් භාර රාජ්‍ය නිවේදිත නිලධරයන්
: මූ.පො.ප. / ස්ථානාධිපතිවරුන් වෙත

## ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධ උපදෙස්

උක්ත කරුණ සම්බන්ධයෙන් දැනටමත් උපදෙස් ලබා දී ඇති 2020.04.07 දිනැති RTM 335 සහ 2020.04.08 දිනැති RTM 359 හි සඳහන් කරුණුවලට අමතර වශයෙන් පහත සඳහන් උපදෙස් ලබාදෙමි

1. යම් ආයතනයක් විසින් ඔබගෙන් සෘජුව ම ඇඳිරි නීති බලපත්‍ර ඉල්ලුම්කරන අවස්ථාවක දී අග්‍රාමාත්‍ය ලේකම්ගේ චක්‍රලේඛ අංක PTF/02 පරිදි කටයුතු කළයුතු ය.

   එසේ වුව ද මවිසින් ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සඳහා අනුමැතිය දී ඔබ වෙත එවනු ලබන ලිපි නැවත ඉහත චක්‍රලේඛය පරිදි ප්‍රාදේශීයව නිර්දේශ ලබා ගැනීම සඳහා යොමු කිරීමේ අවශ්‍යතාවයක් නොමැති බව දන්වා සිටිමි.

2. ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීම සම්බන්ධව යම් ගැටලුසහගත අවස්ථාවක දී කොට්ඨාස භාර නිලධාරී, දිසාභාර නියෝජ්‍ය පොලිස්පති හෝ පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියෝජ්‍ය පොලිස්පති අමතා පැහැදිළි කරගත යුතු ය.

   යම් අත්‍යවශ්‍ය අවස්ථාවකදී 071-8688300 දරණ දුරකථන අංකයෙන් නාගරික සංවර්ධන, ජල සම්පාදන සහ නිවාස පහසුකම් අමාත්‍යාංශයේ ලේකම් සහ සාමාජික - අත්‍යවශ්‍ය මහජන සේවාවන් අඛණ්ඩව සැපයීම මෙහෙයවීම, සම්බන්ධීකරණය හා පසුවිපරම් කිරීම පිණිස වූ ජනාධිපති කාර්ය සාධක බලකාය, ආචාර්ය ප්‍රියත් බන්දු වික්‍රම මහතා ඇමතීම, පළාත් භාර ජ්‍යෙෂ්ඨ නියොජ්‍ය පොලිස්පති විසින් පමණක් සිදුකළ යුතු ය.

3. ඇඳිරි නීති බලපත්‍ර ලබාගෙන යම් කර්මාන්ත ශාලාවක යම් නිෂ්පාදන කටයුතු සිදුකිරීම ආරම්භ කිරීමට පෙර, ප්‍රදේශයේ සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ හා මහජන සෞඛ්‍ය පරීක්ෂක වෙත ඒ බව දැනුම් දී, එම නිලධරයන්ගේ සෞඛ්‍ය ආරක්ෂණ ක්‍රමවිධි හා නිර්දේශ අනුව එම නිෂ්පාදන කටයුතු සිදුකළ යුතු බව ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කරනු ලබන සෑම විටම ඉල්ලුම්කරු වෙත දැනුම්දීමට කටයුතු කළ යුතු ය.

4. ප්‍රදේශයේ සෞඛ්‍ය ආරක්ෂණ තත්ත්වය සහ කර්මාන්ත ශාලාවේ / ආයතනයේ ඉඩ ප්‍රමාණය මෙන් ම සේවකයන් අතර කොරෝනා වෛරසය පැතිරීම වැලැක්වීම සඳහා අනුගමනය කළ යුතු සෞඛ්‍ය ආරක්ෂණ විධි වලට අදාළ පහසුකම් පිළිබඳව සැලකිල්ලට ගෙන අවම සේවකයින් ප්‍රමාණයක් කැඳවීම සහ වාහන ප්‍රමාණයක් භාවිත කිරීම සඳහා උපදෙස් දී, ඒ අනුව ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කළ යුතු ය.

5. තේ, රබර්, පොල්, කුරුඳු, ගම්මිරිස් ආදී අපනයන භෝග සම්බන්ධ කර්මාන්ත, අපනයන කර්මාන්ත, දේශීය කෘෂි කර්මාන්තයට අදාල කර්මාන්ත, අත්‍යවශ්‍ය පාරිභෝගික ද්‍රව්‍ය නිෂ්පාදන ආයතන සහ අදාල සේවාවන්ට පහසුකම් මෙන් ම අමුද්‍රව්‍ය නිෂ්පාදනය කරන ආයතන වලට අවසර ලබාදිය හැක.

6. ආයෝජන මණ්ඩලය (BOI) සහ අපනයන සංවර්ධන මණ්ඩලය (EDB) යටතේ ඇති සියලු ආයතන සඳහා අවසරදීමේ දී අදාල ආයතනයේ ඉහල විධායක නිලධරයකුගේ නිර්දේශය අනිවාර්යයෙන් ම ලබාගත යුතු ය.

7. රාජ්‍ය සහ පුද්ගලික ආයතනවල සේවක වැටුප් හා දීමනා ගෙවීමේ කටයුතු සඳහා අවශ්‍ය අවම සේවක සංඛ්‍යාවකට අවසර ලබාදිය යුතු ය.

8. දැනටමත් 2020.04.10 වන දින දක්වා වලංගු වන ලෙසට නිකුත් කර ඇති හෝ වලංගු කර ඇති සියලු ම ඇඳිරි නීති බලපත්‍රවල වලංගු කාලය 2020.04.30 වන දින දක්වා දීර්ඝ කර ඇත.

9. 2020.04.07 දිනැති RTM 335 මගින් උපදෙස් ලබා දී ඇත්තේ, ඇඳිරි නීති බලපත්‍ර නිකුත් කිරීමේ දී පොලිස් ස්ථානවල සිදුවන තදබදය අවම කිරීම සඳහා වන අතර, නව ක්‍රමවේදය අදාල විය යුත්තේ සියලු ම ඇඳිරි නීති බලපත්‍ර නැවත නිකුත් කිරීම සඳහා නොව, එදින සිට නිකුත් කරනු ලබන නව ඇඳිරි නීති බලපත්‍ර සඳහා පමණි.

10. කොරෝනා වෛරස් රෝග වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා දේශීය හා බටහිර වෛද්‍ය ක්ෂේත්‍රයේ සියලු ම තරාතිරම්වල සේවකයන් රාජකාරී යොදවා ඇති බැවින් එම සේවකයන් සඳහා රාජකාරී / සේවා හැඳුනුම්පත ඇඳිරි නීති බලපත්‍රයක් ලෙස භාවිත කළ හැකි අතර, එයට අමතර ව ආයතන ප්‍රධානියාගේ ලිපියක් අවශ්‍ය නොවන බව දන්වමි.

සී.ඩී. වික්‍රමරත්න
වැඩබලන පොලිස්පති
සී. ඩී. වික්‍රමරත්න
වැඩ බලන පොලිස්පති
පිටපත : ගොනුවට
මං/-